**6.** (i) (අ) ඵලදායීතාවය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02යි)

(ආ) ඵලදායීතාවය මැනීමට යොදා ගන්නා සමීකරණය දක්වා, එමගින් ලැබෙන පිළිතුර ඇගයීමකට ලක් කරන ආකාරය ද පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ii) නිෂ්පාදන ආයතනයක අවශ්‍ය ප්‍රමාණයට වඩා තොග පැවතීම නිසා මුහුණ පෑමට සිදුවන **අවාසි** දායක තත්ත්වයන් **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) (අ) ව්‍යාපාරයක ඉලක්ක වෙත ගමන් කිරීමට අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් අතර පවතින අන්තර් සම්බන්ධතාව පැහැදිලි කරන්න. (ලකුණු 02යි)
(ආ) ප්‍රවර්ධන මිශ්‍රයේ උපකරණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)

(iv) මූල්‍ය කළමනාකරණ තීරණ, ගැලීම් සටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(v) (අ) ඕනෑම ව්‍යාපාර සංවිධානයකට වුව ද මූල්‍ය අවශ්‍යතා පුරෝකථනය කිරීම වැදගත් වේ. යෝග්‍ය මූල්‍ය සම්පාදන මාර්ග තීරණය කිරීමේ දී මූල්‍ය කළමණාකරුවන් යොදා ගන්නා ඍජු මූල්‍ය සම්පාදන මාර්ග **දෙකක්** හා වක්‍ර මූල්‍ය සම්පාදන මාර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)
(ආ) ව්‍යාපාර ආයතනයක මූල්‍ය අනුපාත විශ්ලේෂණ මගින් හඳුනාගත හැකි ප්‍රධාන ක්ෂේත්‍ර නම් කරන්න. (ලකුණු 02යි)
(මුළු ලකුණු 20යි)

**7.** (i) (අ) සීමා සහිත සමාගමකට ලබා ගත හැකි අභ්‍යන්තර මූල්‍ය මාර්ග **තුනක්** නම් කරන්න. (ලකුණු 02යි)
(ආ) දෙමුහුන් මූල්‍යයනය (Hybrid Finance) යනු කුමක් ද? (ලකුණු 02යි)

(ii) (අ) කොළඹ කොටස් වෙළෙඳපොළේ වැදගත්කම අගයන්න. (ලකුණු 02යි)
(ආ) සීමිත සමාගමක්, ලාභාංශ තීරණය කිරීමේ දී සලකා බලන සාධක නම් කරන්න. (ලකුණු 02යි)

(iii) ව්‍යාපාර ආයතනයක් අනාගත මානව සම්පත් අවශ්‍යතා පුරෝකථනය කිරීමේ දී සලකා බලන කරුණු මොනවාදැ යි නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iv) (අ) ඔබ ඇඟළුම් ආයතනයක මානව සම්පත් කළමනාකරුවකු නම්, ආයතනයට සේවිකාවන් බඳවා ගැනීම සඳහා රැකියා දැන්වීමක් පළ කිරීමේ දී ඇතුළත් කළ යුතු තොරතුරු නම් කරන්න. (ලකුණු 02යි)
(ආ) සේවකයන් බඳවා ගැනීමේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය කවර ලෙසින් සුදානම් විය යුතු ද? (ලකුණු 02යි)

(v) ව්‍යාපාර ආයතනයක යහපත් සේව්‍ය-සේවක සම්බන්ධතාවල වැදගත්කම අගයන්න. (ලකුණු 04යි)
(මුළු ලකුණු 20යි)

**8.** (i) දත්ත සැකසුම් ක්‍රියාවලියේ කාර්යයන් නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) පරිගණක ජාලයක (Computer Network) පරිගණක එකිනෙකට සම්බන්ධ වී ඇති ආකාරය අනුව ජාල වර්ග කිහිපයක් හඳුනා ගත හැකිය. ජාල වර්ග **හතරක්** නම් කර, පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) විවිධ සංවිධානමය මට්ටම්වල යොදා ගැනෙන ප්‍රධාන තොරතුරු පද්ධති **හතර** සඳහන් කර එම පද්ධති භාවිත කරන පාර්ශව නම් කරන්න. (ලකුණු 04යි)

(iv) (අ) "ව්‍යාපාර සැලැස්මක් සකස් කරනුයේ ව්‍යාපාරයේ අභ්‍යන්තර අවශ්‍යතා ඉටු කර ගැනීමට පමණක් නොවේ." පැහැදිලි කරන්න. (ලකුණු 02යි)
(ආ) ව්‍යාපාර සැලැස්මක සමාගම් සාරාංශය තුළ ඇතුළත් කරනු ලබන කරුණු මොනවා ද? (ලකුණු 02යි)

(v) (අ) ව්‍යාපාර සැලැස්මක යෝජිත අලෙවි උපාය මාර්ග සඳහා ඇතුළත් විය යුතු තොරතුරු **හතරක්** දක්වන්න. (ලකුණු 02යි)
(ආ) ව්‍යාපාර සැලැස්මක, මූල්‍ය සැලැස්මේ අන්තර්ගත කරුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)
(මුළු ලකුණු 20යි)

***

www.artsapi.lk